***ප්‍රශ්නය : ශ්‍රී ලංකාව රටක් වශයෙන් නිදහස ලබා ගත් මොහොතේ දී ලංකාවේ ආර්ථිකය තිබුණේ දකුණු කොරියාව, සිංගප්පූරුව, ජපානය වැනි රටවල් සමඟ සසඳන විට සෑහෙන ඉහළ මට්ටමක. ගෙවුන කාලය තුළ මෙරට ආර්ථිකයත්, සමාජයත් යම් මට්ටමකින් පහත වැටී ඇති බව පැහැදිලියි. ඔබ වහන්සේට පෙනෙන ආකාරයට මේ සඳහා හේතු වූ කරුණු මොනවාද?***

පිළිතුර : නිදහස ලබා ගන්නා අවස්ථාව වන විට අපි ලෝකයට ශතයක්වත් ණය ගැතිව සිටි රටක් නෙමෙයි. ඒ වගේම ජපානයේ ආර්ථිකයත් සමඟ සසඳන විට අපි සිටියේ සම මට්ටමක. ඒ වගේම සිංගප්පුවරුව වැනි බොහෝ ආසියාතික රටවල් සිටියේ ශ්‍රී ලංකාවට වඩා පහළ මට්ටමක. නමුත් වර්ෂයෙන් වර්ෂය මෙරට ආර්ථිකය ඉහළට ගමන් කළේ නැහැ. අද වන විට අපේ ආර්ථිකය විශාල කඩා වැටීමකට ලක් වෙලා. එයට කරුණු රාශියක් බලපා තියෙනවා.

එකක් එක ප්‍රතිපත්තියක නොසිටීම. දැන් ඉන්දියාව නිදහස ලබන විට මහත්මා ගාන්ධි තුමාගේ දර්ශනය අනුව රටට බලපාන යම් යම් ප්‍රතිපත්ති ඇති කර ගත්තා. අපේ ම ඇඳුම් ඇඳිය යුතුය. අවශ්‍ය ආහාර අප විසින්ම නිෂ්පාදනය කර ගත යුතුය. යා යුත්තේ අප විසින්ම නිපදවා ගත් කාර් එකක වශයෙන් සෑම දෙයක් පිළිබඳව ම අපේ කමක් ඔවුන් ඇති කර ගත්තා. කර්මාන්ත, කෘෂි නිෂ්පාදන, රටට අවශ්‍ය කිරි ඇතුලු සියල්ල තමන් විසින්ම නිපදවා නගා ගත යුතුයි යන මහත්මා ගාන්ධිතුමාගේ දර්ශනය අනුව ශ්‍රී නේරු, ගෝකලී, පටෙල් වැනි රාජ්‍ය නායකයින් ඉදිරියට ගමන් කළා. අඳින්නේ අපේ ම සාරියක්, රෙද්දක්. අපි කන්නේ අපේ ආහාර. ඔවුන්ගේ ඇම්බසඩර් කාර් එකේ යන්නේ හරි ආඩම්බරයෙන්. කවදා හරි අහසට යන්නේ අපේ අහස්යාත්‍රාවක. මේ වගේ ජාතික අභිමානය ඇති කරන මත ඉන්දීය රාජ්‍ය නායකයන්ගේ සිට ජනතාව අතරට ගමන් කළා. ඉන්දියාවට ජාතියක් වශයෙන් නැගී සිටින්න ප්‍රධානම සාධකය මේ ආත්ම අභිමානයයි.

මොන ආවාසනාවකට දන්නේ නැහැ අපේ රටේ ඒ හැඟීම රාජ්‍ය නායකයන් අතරටවත්, ජනතාව අතරටවත් ගමන් කළේ නැහැ. ඩී.එස්. සේනානායක, ඩඩ්ලි සේනානායක වගේ මහත්වරු දේශීය කෘෂි කර්මාන්තය නගා සිටුවන්න මහත් සේ කැප වෙලා ක්‍රියා කළ නායකයින්. අපේ වැව්, අපේ ආර්ථිකය, අපේ කෘෂි කර්මාන්තය පිළිබඳව අදත් අපට සිහි වෙන්නේ. ඩී.එස්. සේනානායක මහතා ගත් ක්‍රියාමාර්ගය නිසා. ඒ මඟ අනුව අපි ඉදිරියට ගෙන ගියා නම් මීට වඩා කෘෂි කර්මයේ දියුණුවක් ලබන්න අවස්ථාව තිබුණා. නමුත් එය අතරමග ඇණ හිටියා. ඊළඟට අපට හරි දැක්මක් තිබුණේ නැහැ. අපි ළමයින්ට උගන්වන්න රජයේ මුදල් විශාල ධනස්කන්ධයක් වියදම් කරනවා. මෙසේ රජයේ මුදල් වියදම් කරලා හදන දරුවා රටට වැඩදායක කෙනෙක් බවට පත් කර ගැනීමේ සැලසුමක් රජයට නැහැ. අපි වියදම් කරලා උගන්වන උපාධිධාරීන් රටට එරෙහිව නැගී සිටින තත්ත්වයට

පත් වෙලා. අධ්‍යාපනය ගැන අපට තියෙන දර්ශනය මොකක්ද? ඒ නිසා අද උගත්කම රටට ප්‍රශ්නයක් වෙලා.

***ප්‍රශ්නය : නිදහස ලබා ගත් පසු අපට ඉදිරියට යන්න අවස්ථාව තිබුණේ ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යුහයක් හරහා. ඒ නිසා මහජනතාවට අවස්ථාව තිබුණා අපේ නායකයින් ගැන තීන්දු ගන්න. යම් යම් ප්‍රතිපත්ති ගැන යම් කිසි මට්ටමකට තීන්දු ගන්න. මහ ජනතාව වශයෙන් අපි මේවා ගැන ගැඹුරට සිතුවේ නැති එකකද ප්‍රශ්නය? නැතිනම් හරි දැක්මක් ඇති නායකයින් බිහි නොවුන එකද? ඉන්දියාව ගැන සඳහන් කිරීමේදී ඔබවහන්සේ පවසා සිටියා ගාන්ධි, නේරු, ගෝකාලි වැනි දැක්මක් තිබුණු නායකයින් ගැන.***

පිළිතුර : ප්‍රධානම කාරණය, ඕනෑම රටක දේශපාලන පක්ෂයක් බලයට පැමිණියහොත් කරන දේ ගැන තමන්ගේම දර්ශනයක් රටට ඉදිරිපත් කරනවා. නමුත් ගත වුණු කාලයේ අපේ රටේ මැතිවරණයක් දිනා ගැනීම සඳහා මිස, කිසිවෙක් රටට පැහැදිලි දර්ශනයක් ඉදිරිපත් කළේ නැහැ. බලය ලැබුණාට පසු අදින් පස්සේ කරන්නේ මොනවාද කියලා කල්පනා කරනවා මිස කලින් සැලසුම් කරන්නේ නැහැ. ලෝකයේ සාමාන්‍යයෙන් ප්‍රබල, අනාගතයේ රටේ බලය ලබා ගන්න බලාපොරොත්තු වන පක්ෂ කැබිනට් එක හදන්නේ දිනලා නෙමෙයි. දිනනන් කලින්. අපේ රටට කැබිනට් එක පත් කරන්නත් සති ගණනාවක් ගත වෙනවා. මොකද තරඟයක් තියෙනවා. අපි ඒ තැන් වලට පත් කරන්නේත් සුදුසු අවබෝධයක් ඇති අය නෙවෙයි. නෑදෑකම්, හිතවත්කම්, මිත්‍රකම් ආදිය සලකලා. දියුණු රටක නම්, යම් පක්ෂයක් බලයට ආවොත් මේ අය තමයි අමාත්‍යවරු වන්නේ කියලා මැතිවරණයට පෙර දන්නවා. ඡන්ද දායකයන් ඡන්දය දෙන්න ඒ දිහා බලනවා. ලංකාවේ මිනිස්සුන්ට ඒ වගේ දැක්මක් නැහැ. එංගලන්තය වගේ දියුණු රටක පක්ෂ වලට වෙන් වුණ ඡන්ද වගේම මැදහත් ඡන්ද විශාල ප්‍රමාණයක් තියෙනවා. ඒ අය පක්ෂ කර ගහගෙනවත්, බෙදිලා වත් නැහැ. ඒ අය කල්පනා කරන්නේ ස්වාධීනව. එවිට කැබිනට් එක දිහා බලනවා. ප්‍රතිපත්ති දිහා බලනවා. ඒ අනුව මැතිවරණයෙන් කවුද දිනන්නේ කියලා තීරණය කරන්නේ පක්ෂ අනුගාමිකයන් නෙමෙයි. මධ්‍යස්ථ අයගේ ආකල්ප අනුව ඔවුන් විසිනුයි.

***ප්‍රශ්නය : අපේ සමාජය මේ තත්ත්වය බලනවා මදි කියලා ද ඔබ වහන්සේ ප්‍රකාශ කරන්නේ?***

පිළිතුර : ඔව්. අපේ සමාජය බලනවා හොඳටම මදි. සමාජය කොතරම් දුර්වල ද කියනවානම් ඔවුන් දේශපාලන පක්ෂ වලට කාවැදිලා. ඒ වගේ ම පක්ෂයටම ගැති වුණ අය. ඒ ගැති කම තුළින් අපට කවදාවත් නිවැරදි තැනට යන්න බැහැ.

*ප්‍රශ්නය : ස්වාමින්වහන්ස, අද තරුණ සමාජය, දේශපාලනයෙන් ටිකක් ඈත් වෙන බවක් පෙනෙනවා නේද?*

පිළිතුර : පක්ෂ දේශපාලනයෙන් ඈත් වීමක් නෙමෙයි. අලුත් පක්ෂ, මේ දේශපාලනයේ විකල්ප සොයනවා. 1970 දී තරුණ පරම්පරාව මේ ප්‍රධාන පක්ෂ දෙකම ප්‍රතික්ෂේප කළා. කවදාවත් මේ දේශපාලනයෙන් රටට වැඩක් වෙන්නේ නැහැ. යහපතක් වෙන්නේ නැහැ. අලුත් මගක ගමන් කරන්න අවශ්‍යයි යන්න කල්පනා කළා. තරුණන්ගේ මතය තිබුණේ විප්ලවකාරි වාමාංශික බලවේගයක්. පැරණි වාමංශික පක්ෂ වලින් අපේක්ෂිත නායකත්වය, අදහස් ක්‍රියාත්මක නොවුණ නිසා ඒ අය නව වාමාංශික දේශපාලන ව්‍යාපාරයකට බැදුණා. අලුත් මගක් හොයන්න උත්සාහ කළා.

**ප්‍රශ්නය : ඔබ වහන්සේට පෙනෙන ආකාරයට දේශපාලනය තුළ ප්‍රතිසංවිධානයක්, ප්‍රතිසංස්කරණයක් කරනවා නම් මුලින්ම ම කළ යුතු කුමක් ද?**

පිළිතුර : ප්‍රධාන වශයෙන් ම රටට නව ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවක් අවශ්‍යයි. නිදහස ලබා ගත් දවසේ සිට අදට අවුරුදු 58 ක් ගත වුණා. අපට ගැලපෙන ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවක් හඳුනා ගන්න තවම නොහැකි වුණා. අපට මුලින් ම ලැබුණේ ඩොමිනියන් තත්ත්වය. එය එංගලන්තයේ බලපෑම මත සාදා ගත් ඩොනමෝර් ආණ්ඩුක්‍රමයක්. ඊට පසු ජනරජ ව්‍යවස්ථාව හැදුවා. පසු 1978 ජේ.ආර්. ජයවර්ධන මහතාගේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ආවා.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සකස් කරන විට රටේ ඉතිහාසය, ආර්ථිකය දෙස බලන්න අවශ්‍යයි. දැනට ක්‍රියාත්මක වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව විශාල අර්බුද රාශියකට හේතු වෙලා. ප්‍රධාන වශයෙන්ම විධායක බලය ඇති ජනාධිපති ක්‍රමය. විධායක බලය ඇති ජනාධිපතිවරයෙකු හොඳයි. නමුත් මෙවැනි විධායක බලයක් ඇති ජනාධිපති කෙනෙක් අමෙරිකාවෙත් නැහැ. අඩුම වශයෙන් විධායක ජනාධිපතිවරයා කවරෙකුට හෝ වගකියන්න උවමනායි. පාර්ලිමේන්තුවට වගකියන, ජනතාවට වගකියන, විශේෂයෙන් නීතියට අවනත ජනාධිපති ක්‍රමයක් ලංකාව හඳුනා ගන්න අවශ්‍යයි.

ඊළඟට ජනතාවට වගකියන මන්ත්‍රීවරු අවශ්‍යයි. මේ ව්‍යවස්ථාව යටතේ දිස්ත්‍රික් ක්‍රමයට මන්ත්‍රීවරුන්ට විශාල ප්‍රදේශයකට තරඟ කරන්න සිදු වෙලා. දිස්ත්‍රික් ක්‍රමයට, තරඟ කරන විට ප්‍රචාරක කටයුතු සඳහා විශාල ධනයක් වියදම් කරන්න සිදු වෙනවා. ඡන්දය දිනා ගත් පසු ඡන්දයට කලින් මේ වියදම් කරපු මුදල් සොයා ගන්න අවශ්‍යයි. ඒ නිසා මැතිඇමතිවරු අනිවාර්යයෙන්ම දූෂණ, අල්ලස් වැනි දේ වලට පෙළඹෙනවා. නැතිනම් මේ මුදල් කන්දරාව සොයා ගන්නේ කොහොමද?

අනෙක් කාරණය, මේ තත්ත්වයට මුහුණ දෙන්න හැකි ධනවතුන්ට හා බලවතුන්ට පමණයි. මැතිවරණයකට මුළු දිස්ත්‍රික්කයම හඳුනා ගන්න වෙනවා. මෙයින් බලවත් පුද්ගලයන් පමණක් පාර්ලිමේන්තුවට යනවා. එදා ප්‍රාදේශීය සභාවෙන්, පලාත් සභාවෙන්, නගර සභාවෙන් අනුපිළිවෙලින් පාර්ලිමේන්තුට යන්න ගමේ තරුණයාට අවස්ථාව තිබුණා. දැන් ඒ අවස්ථා සියල්ලම ඇහිරිලා. එදා මැතිවරණ පවත්වද්දී අපේක්ෂකයා තමන්ගේ පාක්ෂිකයින් සමඟ ගමේ ගෙවල් වලට යනවා. එයාට තිබුණේ පයින් යන්න පුළුවන් බල ප්‍රදේශයක්. කවර පක්ෂයකින් පැමිණියත් මහජනතාව හොඳට හඳුරන කෙනෙක්. එනිසා ඕනෑම වේලාවක අපිට මුණ ගැහෙන්න, විවේචනය කරන්න වුණත් පුළුවන්. දැන් එහෙම කතා කරන්න බැහැ. ''අපිට ඡන්දය දුන්නාද? තමුන් කොහේද ඉන්නේ'' කියලා අහනවා. ඔවුන් ජනතාවට වග කියන්නේ නැහැ. ජනතාවට වග නොකියන මන්ත්‍රීවරු පත් කරන ක්‍රමයක් මේ ව්‍යවස්ථාව නිසා ඇති වෙලා. ඒ නිසා මන්ත්‍රී කොට්ඨාශය කුඩා වෙන්න ඕනේ. ජනතාවට වග කියන්න අවශ්‍යයි.

***ප්‍රශ්නය : ඔබ වහන්සේ පවසන ආකාරයට නව ව්‍යවස්ථාවක් නිර්මාණය කරන්න නම් එය කළ යුතු ක්‍රමය කුමක්ද? සමහර රටවල ඡන්දයෙන්ම නව ව්‍යවස්ථාවක් තෝරනවා. අලුත් ව්‍යවස්ථාවක් නිර්මාණය කරලා. ඒ මගින් අලුත් ගමනක් ආරම්භ කරනවා. අපිට ගැලපෙන ක්‍රමය කුමක්ද?***

පිළිතුර : බුද්ධිමතුන්ගෙන් සමන්විත වු විශේෂ කාරක සභාවක්, මණ්ඩලයක් හෝ කොමිෂන් සභාවක් පත් කර ජනතා අදහස් ලබා ගැනීම වැදගත්. මේ සඳහා හය මාසයක පමණ කාලයක් දෙන්න අවශ්‍ය වෙනවා. විවිධ පක්ෂ, පුද්ගලයන්, සංවිධාන හා රටේ ජනතාවගෙන් අදහස් ලබා ගත යුතුයි. ගමට අවශ්‍ය කරන පාලනය දන්නේ ගමේ මිනිස්සු. ගැමියා මහ උගතෙක් නොවෙන්න පුළුවන්. නමුත් ඔහු ගමට අවශ්‍ය කුමක්ද යන්න දන්නවා. ඒ නිසා මුළු මහත් ජනතාවටම අදහස් දෙන්න, කථා කරන්න අවස්ථාවක් සලසා දීම අවශ්‍යයි. ඉන් පසු එම අදහස් සාමාලෝචනය කර රටේ ඉතිහාසය හදාරා නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සකස් කර ගත හැකියි. අපට ජනාධිපතිවරණය හා මහ මැතිවරණය එකම දවසක පැවැත්විය නොහැකිද? පලාත් සභා ඇත්තටම අවශ්‍ය කරනවාද? එය සාකච්ඡාවට භාජනය විය යුතු දෙයක්. පලාත් සභා ඇති කළේ වැඩ ඉක්මන් කරන්න. නමුත් දැන් ක්‍රියාත්මක වන ආකාරයට වැඩ කරන්න බැහැ. අධ්‍යාපනය අවුලක්. ඒ අවුලට එකම හේතුවත් පලාත් සභා. අනෙක මහජනතාවට වැඩක් කර ගන්න ගියාම මහ ආණ්ඩුවෙන්, පළාත් සභාවෙන්, නගර සභාවෙන් අවසර ගන්න අවශ්‍ය කරනවා. මම හිතනවා මහත්මා ගාන්ධිතුමාගේ ග්‍රාමරාජ්‍ය සංකල්පය අනුගමනය කළ හැකි නම් හරි වැදගත්. බොහෝ දෙනා චෝදනා කරන්නේ සියලු සම්පත් ගමට එන්නේ නැහැ කොළඹට සීමා වෙලා කියලා. ඒ නිසා ග්‍රාමරාජ්‍ය සංකල්පය වැනි අදහසක් ගැන කල්පනා කළොත් නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් හදන විට එය වැදගත්.

කුඩාම ඒකකය වන ගමේ සිට ඉහළට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සකස් විය යුතුයි. ගම පාලනය කරන්නේ ගමෙන් ම පත් කර ගත් පිරිසක්. ගමට අවශ්‍ය දේ කුමක් ද කියලා ඔවුන් දන්නවා. මන්ත්‍රීවරයාට අවශ්‍ය වෙන්නේ ඔහුට අයිති ප්‍රදේශය තුළ ඇති ගම් ටික සකස් කර ගැනීම පමණයි.

*ප්‍රශ්නය : ඉතිහාසයට අනුව මට නිතරම මතු වන ප්‍රශ්නයක් අපේ පාලන සංස්කෘතිය කුමක්ද යන්න. එංගලන්තයේ ආකාරයට රජයේ එක් පක්ෂයක් ඉන්නවා. විපක්ෂයේ එක් පක්ෂයක් ඉන්නවා. රජයේ අදහස් වලට විපක්ෂය විරුද්ධ වෙනවා. එය හරහා තමයි ප්‍රජාතන්ත්‍රවාදි සමබර බව හරි ආකාරයෙන් රැක ගන්නේ. නමුත් ඇතැම් අවස්ථාවල කලාතුරකින් විපක්ෂය රජය හා එකඟව කටයුතු කරනවා.*

*දෙවැනි ලෝක යුද්ධය අවස්ථාවේ ආණ්ඩුව විපක්ෂය ල එකට එකතු වී වැඩ කළා. පැරණි යටත් විජිත යුගයට පෙර අපේ ඉතිහාසය දෙස බැලු විට අපිට ගැලපෙන සංස්කෘතිය කුමක්ද? ඒ ආකාරයේ ක්‍රමයක් ද? නැතිනම් මීට වඩා සමගියක් ඇති කිරීමද? අපට ගැලපෙන ක්‍රමය කුමක්ද ?*

පිළිතුර : අපේ රටේ අවුරුදු දහස් ගණනක් රජුන් යටතේ පාලනය වුනා. තවමත් අපේ හිතේ ඒ මානසිකත්වය තිබෙනවා. සාමාන්‍යයෙන් අපට කල්පනා වෙනවා එබඳු පුළුල් බලතල ඇති රජෙක් අපට ඉන්නවානම් කියලා. රජ්ජුරුවෝ ඉන්නවා. රජ්ජුරුවන්ට ඇමති මණ්ඩලයක් ඉන්නවා. රජ්ජුරුවෝ ක්ෂණික තීරණ ගන්නවා. ඒ නිසා ක්ෂණික ආර්ථික සංවර්ධනයක් ඇති කරන්න හැකියාව තිබෙනවා. දැන් තිබෙන ක්‍රමයෙන් කතා කර ඉන්නවා මිසක් වැඩක් කෙරෙන්නේ නැහැ. එදා තිබුණ ඒ රජ පාලනය තුළින් ක්ෂණිකව තීරණ ගන්නවා. ක්ෂණිකව වැඩ කරනවා.

*ප්‍රශ්නය : ස්වාමින් වහන්ස අපේ සමාජයේ බලාපොරොත්තුව ඒ වගේ බලතල තියෙන නායකයෙක් ද?*

පිළිතුර : අපට එහෙම උවමනාවක් නැහැ. නමුත් දැන් මේ යන ආකාරයට අපි බලයට ඇවිත් මුදල් නාස්ති කරනවා මිසක් වැඩක් කරන්නේ නැහැ. පුළුල් බලතල ඇති නායකත්වයක් රටට අවශ්‍යයි. ඒ නායකයා ජනතාව විසින් තෝරා ගත යුතුයි. එදා ඉතිහාසයේ රජ්ජුරුවන්ට තිබුණ බලතල තමයි අද ජනාධිපතිවරයාට තියෙන්නේ. සියල්ල ක්‍රියාත්මක නොවෙන්න පුළුවන්. නමුත් ඒ බලය සම්පූර්ණයෙන්ම තියෙනවා. පාර්ලිමේන්තුව බොහෝම දුර්වල තත්ත්වයට පත් වෙලා. පාර්ලිමේන්තුව නොමැතිව වුවත් මේ ක්‍රමය යටතේ රට පාලනය කරන්න පුළුවන්. ඩොනමෝර් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ගත් විට එහි ඇත්තේ ඡන්දයෙන් මන්ත්‍රීවරු පත් කර අවසානයේ ඒ සියලුම මන්ත්‍රීවරුන් කාරක සභාවලට පත්

කරන ක්‍රමයක්. කෘෂි කර්ම අමාත්‍යාංශය ගත් විට එහි පක්ෂ විපක්ෂ භේදයක් නැහැ. අනෙක් පක්ෂ වල සිටින ඒ විෂය පිළිබඳ දැනුමක් තියෙන අය මේ කාරක සභාවට අයිතියි. එතකොට විපක්ෂයක් නැහැ. සියලු දෙනාම මෙම කාරක සභාවලට පත් වෙලා. එකට එකතු වෙලා ප්‍රතිපත්ති සම්පාදන කරනවා. කිසිවෙකුට විරුද්ධ වෙන්න බැහැ. විපක්ෂය කියන වචනයක් සමඟ, ඔවුන් තරහා කාරයෝ, විරුද්ධවාදීන් කියන මතය ඇති වෙලා. මේ ක්‍රමය අපි නැති කරන්න අවශ්‍යයි. ඩොනමෝර් ක්‍රමයෙන් වුනත් මේ සඳහා යම් දෙයක් ගන්න පුළුවන්.

*ප්‍රශ්නය : එක පැත්තකින් සමාජයේ බලාපොත්තුවක් තියෙනවා දැඩි තීන්දු ගන්න පුළුවන් නායකයෙන් හෝ නායිකාවක් සිටිය යුතු බවට. අනෙක් පැත්තෙන් මීට වඩා සමඟියෙන් සාමූහිකව තීන්දු ගන්න උමනාවක් සමාජයේ තියෙනවා. ස්වාමින්වහන්ස, මේ දෙකම අපි එකතු කරනවා නම් කොහොමද?*

පිළිතුර : පාර්ලිමේන්තුව සියලුම පක්ෂ වලින් සමන්විත වූ ව්‍යවස්ථාදායක මණ්ඩලයක් ලෙස යම් යම් පනත් සම්පාදනය කරන විට එයට විරුද්ධ වෙන්න විපක්ෂයට හැටියක් නැහැ. ඒ අයත් සම්බන්ධ නිසා ඉතාම සාමූහිකව සියලු දෙනා එකට එකතු වී රට ගොඩ නැගීමේ කාර්යය සිදුවේවි. ඊළඟට අපට විධායක බලතල ඇති ජනාධිපතිවරයෙක් අවශ්‍යයි. නමුත් ඒ ජනාධිපතිවරයා නීතියට යටත් විය යුතුයි. ඒ ජනාධිපතිවරයා පාර්ලිමේන්තුව වග කියන්න අවශ්‍යයි. පාර්ලිමේන්තුවට වගකීමත්, නීතියට යටත් වීමත් දෙක ඇතිව පුළුල් බලතල ඇති ජනාධිපතිවරයෙකු රටට අවශ්‍ය වෙනවා. නැතිනම් ලංකාව වැනි රටක වැඩ කෙරෙන්නේ නැහැ. වැඩ බොහෝම ප්‍රමාද වෙනවා. ප්‍රේමදාස මහතා වැනි ජනාධිපතිවරුන්ට බොහෝ වැඩකටයුතු කරන්න හැකි වුණේ ක්ෂණිකව තීරණ ගැනීම හා ක්ෂණිකව ක්‍රියාත්මක වීම නිසා. අද ඒ දේ සිදු වන්නේ නැහැ.

*ප්‍රශ්නය : අපේ ඉතිහාසය බැලුවත් බුද්ධ ධර්මය හා සංස්කෘතිය එකතු වෙලා තමයි පැවතිලා තියෙන්නේ. හැබැයි අපේ දේශපාලන සංස්කෘතිය හා සමාජ සංස්කෘතිය බැලුවත් ඒ තුළ ධර්මය හරහා යන මධ්‍යස්ථ අදහස් එදිනෙදා ප්‍රායෝගිකව භාවිතයට ගන්නවා මදි. මේ පිළිබඳ ඔබ වහන්සේගේ අදහස කුමක්ද?*

පිළිතුර : අවුරුදු දහස් ගණනක සිට රාජ්‍ය පාලනය බුදු දහම සමඟ එකට ගමන් කරලා තියෙනවා. ඇතැම් ශිලා ලේඛණ වල සඳහන් වෙලා තියෙනවා ලංකාවේ රජ කළ යුත්තේ බෝධිසත්වයෙක් පමණයි කියලා. බෞද්ධයෙක් පමණක් නොවෙයි ඔහු බෝධිසත්වයෙක් විය යුතුයි. බෝධිසත්වයෙක් කී පමණින් ආගමික වශයෙන් කිසි මතභේදයක් හදා ගන්න දෙයක් නැහැ. බෝධිසත්වයෙක් කියන්නේ උදාර මිනිසෙක් කියන එක. ක්‍රිස්තියානි, මුස්ලිම් කියලා වෙනසක් නැහැ. උදාර මිනිසෙක් රජකමට පත් වෙන්න අවශ්‍යයි කියන සංකල්පය අපට තිබුණා.

එපමණක් නෙමෙයි රජවරුන්ට දසරාජ ධර්මයෙන් රට පාලනය කළ යුතු බවට සමාජ, ආගමික බලපෑමක් තිබුණා. රජවරු දැහැමෙන් සෙමින් රජ පාලනය කළ බවට අපේ ඉතිහාසයේ ද සඳහන් වෙනවා. රජු ධාර්මික වුණා. සාමකාමී වුණා. ඒ වගේම සමාජ බලපෑම තුළ තමයි රජතුමන් රට පාලනය කළේ. රජු හැම විටම රටේ මහා සංඝයාවහන්සේලාගේ අදහස් සැලකිල්ලට ගෙන රට පාලනය කළා.

පෘතුගීසින්, ලන්දේසීන් වැනි විදේශිකයන් පැමිණෙන්නට පෙර ලංකාවේ සිටියේ බෞද්ධයෝ. ඒ නිසා රජ්ජුරුවෝ හැම විටකම මහා සංඝයාවහන්සේලාගේ අදහස් විමසමින් කටයුතු කළා. ඉතිහාසයේ සඳහන් වෙනවා ලංකාවේ ආණ්ඩු දෙකක් පැවති බව. රටේ තිබෙන සාමාන්‍ය ආණ්ඩව එකක්. සංඝයා වහන්සේලාගේ වෙනම ආණ්ඩුවක්. ඒ නිසා ආණ්ඩු දෙකක් ක්‍රියාත්මක වුණා. 'සංඝරාජ' කියලා රජ කෙනෙක් සිටියා.

අපේ සංඝරාජ ස්වාමීන් වහන්සේට ''අෂ්ඨායතනය'' කියලා ප්‍රධාන ආයතන අටක් තිබුණා. ඒ ආයතන වල නායක ස්වාමීන්වහන්සේලා කැබිනට් ඇමතිවර හා සමානයි. රජතුමන් අවශ්‍ය අවස්ථාවලදී ඒ ස්වාමීන්වහන්සේලා කැඳවලා සාකච්ඡා කරනවා. මහා පරාක්‍රමබාහු රජ්ජුරුවෝ දකුණු ඉන්දියාව සමඟ විශාල යුද්ධයකට යන්න සුදානම් වුණා. ඒ ගැන ස්වාමීන්වහන්සේලාගෙන් විමසුවා. උන්වහන්සේලා පවසා සිටියා ඔබතුමා එයට සහභාගි වෙන්න අවශ්‍ය නැහැ කියලා. ස්වාමීන්වහන්සේලා තමයි කළ යුත්ත, නොකළ යුත්ත කුමක්ද කියා තීරණය කළේ. ඒ වගේ ආගමික පසුබිමක් තිබුණා වගේම 1956 දී බණ්ඩාරණායක මහත්මයා හා ඉන්දියානු අග්‍රමාත්‍ය ශ්‍රී නේරු මහත්මයා අසල්වාසීන් හා බොහෝම ළඟ මිතුරන් හැටියට ප්‍රතිපත්තිමය තීරණයක් ගත්තා ''රටවල් දෙක පංචශීල ප්‍රතිපදාව මත පාලනය කරමු'' කියලා. පංචශිල ප්‍රතිපදාව ගැන සඳහන් කළ විට එක වරම ඇති වන්නේ ආගමික හැඟීමක්. නමුත් එහි බෞද්ධ, හින්දු, කතෝලික කියලා ආගමික ප්‍රශ්නයක් නැහැ. මෙය රාජ්‍ය ප්‍රතිපත්තියට ඇතුළත් විය යුතු දෙයක්.

එදා මහ මුහුද ගොඩ ගලපු සුනාමි අවස්ථාවේ කොළඹ හෙන්ද්‍රි පේරිද්‍රික් උද්‍යානයට සියලු පක්ෂ වල නායකයෝ එකතු වෙලා අධිෂ්ඨාන පූජාවක් කළා. සියලු ආගමික නායකයෝ පැමිණියා. ඒ අධිෂ්ඨාන පූජාවේදී මුස්ලිම් ආගමික නායකයා කියා සිටියා මේ රට පංචශිල ප්‍රතිපදාව මත පාලනය කළ යුතුයි කියලා. එතුමා වගේ කෙනෙක් එවැනි දෙයක් ප්‍රකාශ කිරීම හරි වටිනවා. මෙම පංච ශීල ප්‍රතිපදාව අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුළත් කර එය ක්‍රියාවට නැගුවොත් මේ කියන බොහෝ ප්‍රශ්න වලින් අපිට ගොඩ එන්න පුළුවන්. පාණාතිපාතා වේරමණී ශික්ඛා පදං සමාදියාමි කියන සික්ෂා පදය එක්සත් ජාතීන්ගේ මිනිස් අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තියේ පවා තියෙනවා. මිනිස් අයිතිවාසිකම් ප්‍රඥප්තියට ආගමික පදනමක් නැහැ. ඒ නිසා ඊට බාධා වන දේ ඉවත් කිරීමට රජය ක්‍රියා කරන්න

අවශ්‍යයි. මිනිසාට නිදහසේ ජීවත් වීම සඳහා තියෙන සියලුම බාධා ඉවත් කරලා නීතිය ක්‍රියාත්මක කළ යුතුයි. නැතිනම් එය සිල් පදයක් පමණයි.

*ප්‍රශ්නය : ඉතිහාසයේ තිබුණ සංඝරාජ පදවිය පිළිබඳ ඔබ වහන්සේ සඳහන් කර සිටියා. අද රජයත් සංඝයා වහන්සේලාත් අතර තිබෙන සම්බන්ධ තාවය, උපදෙස් ගන්න ආකාරය නිසි පරිදි සකස් වී නැහැ ඉතිහාසය සලකා කොහොමද අපි ඒ තත්ත්වය හදා ගන්නේ. එදා ඒ සම්බන්ධතාවයක් තිබුණා. නමුත් මෑත කාලයේ සංඝයාවහන්සේලා අතර බෙදීමක් තියෙනවා. එකඟතාවයක් නැහැ.*

පිළිතුර : ශාසනයේ ගිහි ආරක්ෂයා රටේ රජ්ජුරුවෝ. ඒක අපේ සාම්ප්‍රදායික ගමන. ශාසනයේ කිසියම් පරිහාණි අවස්ථාවක් උදා වුණ හැම විටම රජ්ජුරුවෝ ක්‍රියාත්මක වුණා. ක්‍රියාත්මක වෙලා ඒ පරිහාණියෙන් ශාසනය බේරා ගත්තා. ලංකාවේ අනුරාධපුර රාජධානිය බිඳ වැටුණා. චෝල ආදි ආක්‍රමණ වලින් ශාසනික වශයෙන් විශාල පරිහාණියක් රටේ ඇති වුණා. ඒ ශාසනික පරිහාණියෙ දී මහා විජයබාහු රජ්ජුරුවෝ ශාසන සංශෝධයක් කළා. නමුත් එතරම් සාර්ථක කර ගන්න බැරි වුණා. උපසම්පදාව නැවත ඇති කළා. නමුත් මහා පරාක්‍රමබාහු රජු සමයේ අභයගිරිය, ජේතවනය හා මහාවිහාරය යනුවෙන් නිකාය තුනකට බෙදුනා. මහා පරාක්‍රමබාහු රජු මහ බලවත් රජෙක් නිසා සියලුම සංඝයා වහන්සේලා කඳවලා තුන් නිකාය එක් නිකායක් බව පත් කළා. දුස්සිල් මහණුන් කැඳවලා ගිහියන් බවට පත් කළා. ඒ පරීක්ෂණය කර තිබන්නේ රජතුමන්මයි. සෙල් ලිපි වල සඳහන් වෙනවා. ''තුන්යම් රෑ නොනිදා අවදිව සිට එක එක්කෙනා ගෙනවිත් පරීක්ෂණ පවත්වා සුදු පිළි අන්දවා රැකියා ලබා දී පිටත් කළා.'' කියා. දුස්සිල් භික්ෂූන් ශාසනයෙන් නෙරපීම කළේ රජ්ජුරුවෝ. එහෙම කරලා ශාසන සංශෝධනයක ඇති කළා.

ඉන්පසු රජ්ජුරුවන්ගේ මාළිගාව වටා ''අෂ්ඨායතන'' ස්වාමින්වහන්සේලාගේ විහාරස්ථාන අට යළි ගොඩනැගුවා. එසේ කළේ හිදිසියේ වහා කැඳවා ගන්න. නිශ්ශංකමල්ල රජතුමා නැවත වතාවක් ශාසන සංශෝධනයක් කළා. ඊට පස්සේ දඹදෙණියේ පණ්ඩිත පරාක්‍රම බාහු රජ්ජුරුවෝ කතිකාවතක් කළා. එලෙස එක් එක් අවස්ථා වල ශාසනය දුර්වල වන විට ගොඩ ගත්තා. නුවර යුගයේ අන්තයටම පිරිහුණා. නමුත් රජතුමන්ගේ මූලිකත්වයෙන් සංඝරාජ හාමුදුරුවෝ නැවත සංඝ ශාසනය ආරම්භ කළා. දැන් අපේ රටේ බුද්ධ ශාසන අමාත්‍යංශයක් තිබෙනවා. ඒ අනුව ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ ''බුද්ධාගමට ප්‍රමුඛත්වයක් පිරිනමනු ලැබේ'', ''බුද්ධාගම රක්ෂණය කර පෝෂණය කිරීම රජයේ පරම යුතුකම වන්නේය'' කියලා වාක්‍ය තියෙනවා. දැන් ඒ නිසා එය ක්‍රියාත්මක විය යුතුයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ වාක්‍යයක් පමණක් තිබුණාට ප්‍රමාණවත් නැහැ. බුද්ධාගම රක්ෂණය කරන්න, පෝෂණය කරන්න හා ආරක්ෂා කරන්න අද සිදු වෙලා. මෙය

අපට පමණක් එකතු වෙලා කරන්න හැකියාවක් නැහැ. ස්වාමින්වහන්සේලා සහ රජය නායකත්වය ගත යුතුයි. මුලින්ම රජු රටේ ප්‍රධාන ආරක්ෂකයා. ඒ අනුව බුද්ධ ශාසන අමාත්‍යධූරය රටේ නායකයා ගන්නම අවශ්‍යයි. රටේ ජනාධිපතිවරයා බුද්ධ ශාසන අමාත්‍යධූරය ගැනීම අනිවාර්යය වෙනවා. ඉන්පසු මේ රාජ්‍ය නායකයා මේ ස්වාමින්වහන්සේලාගෙන් උපදේශක මණ්ඩලයක් පත් කර ගත යුතු වෙනවා. ලංකාවේ තවත් ආගම් තිබෙන නිසා රටේ නායකයා අනිකුත් ආගම් වලිනුත් වෙනම උපදේශ මණ්ඩලයක් පත් කර ගත යුතුයි. ඒ අයගෙනුත් උපදෙස් ගත යුතු වෙනවා. එවිටයි ආගම් අතර සමතුලිත තාවයක් ඇති වන්නේ.

මේ ආකාරයෙනුයි මේ ගමන යා යුත්තේ. රටේ නායකයා තනියම යනවා. හාමුදුරුවරු විවේචනය කරනවා. අපි දෙගොල්ලන් අතරේ සම්බන්ධීකරණයක් ඇත්තේම නැහැ. ඒ සම්බන්ධීකරණයක් නැති කම තමයි බොහෝ අවුල් වලට මුල. ඒ නිසා අපි මේ සියලු කොටස් එකට සම්බන්ධ කර ගත යුතුයි.

*ප්‍රශ්නය : ස්වාමින් වහන්ස, අවසාන වශයෙන් මෙම ගමන කොතනින් ද ආරම්භ කරන්න පුළුවන්?*

පිළිතුර : මුලින්ම ආරම්භ කළ යුතු වන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන්. නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් හඳුනා නොගෙන මෙය කරන්න බැහැ. රට පාලනය කිරීම කියන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ක්‍රියාත්මක කිරීමයි. එතැන වැරදි නම් සියල්ලම වරදිනවා. පක්ෂ විපක්ෂ දෙගොල්ලන්ම මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අද රටට ගැලපෙන්නේ නැති බව පිළිගන්නවා. ව්‍යවස්ථාවේ විශාල වෙනසක් ඇති කරන්න අවශ්‍ය බව පෙනෙනවා. අද පවතින ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පක්ෂ ඇතුලේම අරගල ඇති කරනවා. පක්ෂ පක්ෂ අතර ගැටුම් ඇති කරනවා. විශාල ධනස්කන්දයක් වියදම් කර වසරක්, වසරක් පාසා මැතිවරණ පවත්වනවා. කාටවත් වැඩක් කරන්න බැහැ. රට දියුණු කරන්න සූදානම් වෙනකොටම ආණ්ඩුව වැටෙනවා. නමුත් ඉන්දියාවේ එකක් තියෙනවා. ඉන්දියාවේ මාසෙන් මාසේ ආණ්ඩු වැටුණත් කමක් නැහැ ඔවුන් යන දර්ශනය හදා ගෙන අවසානයි. ආණ්ඩුව වැටුණට කමක් නැහැ. ඩ්‍රයිවර් මාරුවෙනවා විතරයි. ඊළඟ කෙනා වාහනයේ පාලනය රැගෙන පදවාගෙන යනවා. නමුත් අපි වාහනය ගත් විට යන්න පාරක් නැති නිසා ආපසු පදවාගෙන යනවා. අපි අතරමං වුණ පිරිසක්. ඒ නිසා මේ වෙනස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළින් ම එන්න අවශ්‍යයි. රටට අවශ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය කර ස්ථාවරව තියන්න අවශ්‍යයි. කවුරු බලයට ආවත් කමක් නැහැ රටට ගැලපෙන ප්‍රතිපත්ති ඉදිරියට කරගෙන යන්න අවශ්‍යයි. හොඳ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්මත කරගෙන ක්‍රියාවට නැගීමෙන් අනෙක් සියලු දේම හදන්න හැකිවෙනවා.

**ස්තුතියි ස්වාමින් වහන්ස.**